

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education



අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2025
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2025


| 13 ශ්‍රේණිය | 45 | S | I | බෞද්ධ ශිෂ්ටාචාරය - I<br>Buddhist Civilization - I | කාලය : පැය දෙකයි<br>Time : Two hours |
|---|---|---|---|---|---|

**උපදෙස් :**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන එය පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

01. වෛදික ඉගැන්වීම් අනුව විශ්වය හා සත්වයා මවන ලද්දේ සර්ව බලධාරී මහා බ්‍රහ්මයා විසිනි. මිනිසා හා බ්‍රහ්මයා අතර සම්බන්ධය තහවුරු කිරීමෙහිලා ඔවුන් උපයෝගී කරගත් සංකල්පයක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) භූත බලය ඉගැන්වීමයි.
(2) විශ්ව බලය පිළිබඳ ඉගැන්වීමයි.
(3) කාය බලය පිළිබඳ ඉගැන්වීමයි.
(4) ආත්ම බලය පිළිබඳ ඉගැන්වීමයි.
(5) ධර්ම බලය පිළිබඳ ඉගැන්වීමයි.

02. මිනිසකුගේ උත්පත්තිය සමඟ ඔහුට නියමවන රාජකාරියක් මැවුම්කරුවා විසින් නියම කොට ඇති බව වේදයේ දැක්වේ. එම ආගමික ඉගැන්වීම හඳුන්වන්නේ,
(1) වර්ණ ධර්ම නමිනි. (2) ස්වධර්ම නමිනි. (3) ආශ්‍රම ධර්ම නමිනි.
(4) ආපද් ධර්ම නමිනි. (5) උදක පාරිශුද්ධිය නමිනි.

03. මිනිසකුගේ උත්පත්තිය සමඟ ඔහුට නියමවන රාජකාරියක් මැවුම්කරුවා විසින් නියම කොට ඇති බව වේදයේ දැක්වේ. එම ආගමික ඉගැන්වීම හඳුන්වන්නේ,
A. ආපද්ධර්ම බ්‍රාහ්මණ දේව නිර්මාණවාදී ආගමික ඉගැන්වීමකි.
B. ආපදාසන්න අවස්ථාවලදී බමුණෝ සමාජයේ යහපැවැත්ම වෙනුවෙන් පෙරමුණ ගෙන ක්‍රියා කළහ.
C. ආපද්ධර්ම මඟින් පහළ කුලවල අයට ඉහළ කුලවලට අයත් රැකියාවල නියැලීමට අවස්ථාව ලැබුණි.
D. ආපද්ධර්ම ක්‍රියාත්මක කිරීමේ බලය ක්ෂත්‍රියයන්ට පවරා තිබුණි.
E. ශූද්‍රයාට ආපද් ධර්මයක් නැත.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් ආපද් ධර්ම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ ඇතුළත් වරණ දෙක තෝරන්න.
(1) A සහ B ය. (2) A සහ C ය. (3) C සහ D ය.
(4) D සහ E ය. (5) A සහ E ය.

04. බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව සන්‍යාසි ආශ්‍රමයේ දී සිදු කළ යුතු ප්‍රධානතම කාර්යය ලෙස හඳුනාගත හැක්කේ, බ්‍රහ්ම සහව්‍යතාව වෙනුවෙන්,
(1) වනගතව සිටීමයි.
(2) ස්තෝත්‍ර ගායනා කිරීමයි.
(3) අනගාරිකව සංචාරක ජීවිතයක් ගත කිරීමයි.
(4) වේද අධ්‍යනය කිරීමයි.
(5) වතාවත් කිරීමයි.

05. බ්‍රාහ්මණ සංස්කෘතියේ ප්‍රමුඛ ආගමික සංස්කාර විධියක් වූ යාග කර්මයේ දෙවියන්ට ආරාධනා කරන බමුණු පූජකවරයා හැඳින්වෙන්නේ,
(1) හෝතෘ නමිනි. (2) අධ්වර්යු නමිනි. (3) උද්ගාතෘ නමිනි.
(4) යාඥාකාරක නමිනි. (5) යාඥාග්‍රාහක නමිනි.

06. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව ජන්මීය සාධක පදනම් කොටගෙන මානව වර්ගයා උසස් පහත් ලෙස වර්ගීකරණය කිරීම විවේචනයට ලක් කොට මිනිසාගේ ශාරීරික සමානතා ගෙන හැර දක්වමින් බුදුරජාණන් වහන්සේ විසින් වාසෙට්ඨ සූත්‍රයෙහිලා ඉදිරිපත් කොට ඇති සාධක,
(1) ජීව විද්‍යාත්මක වේ. (2) ආචාර විද්‍යාත්මක වේ. (3) සමාජ විද්‍යාත්මක වේ.
(4) දේශපාලනික වේ. (5) ඓතිහාසික වේ.

07. "කරොතෝ බෝ මහාරාජ කාරයතෝ ඡින්දතෝ ඡේදයතෝ පචතෝ පචායතෝ....." යනාදි ලෙසට ෂට් ශාස්තෘන් අතර "අකිරියවාදී" දර්ශනයක් හඳුන්වා දුන් ශාස්තෘවරයා.
(1) පූර්ණ කස්සප නම් වේ. (2) මක්ඛලී ගෝසාල නම් වේ. (3) අජිත කේශකම්බලී නම් වේ.
(4) පකුධ කච්චායන නම් වේ. (5) සංජය බෙල්ලට්ඨිපුත්ත නම් වේ.

08. ගංගා මුවෙහි ගිල්වා තබන ලද කෙමිසා බොහෝ මත්ස්‍යයන්ගේ විනාශය පිණිස හේතු වන්නා සේ බොහෝ මිනිසුන්ට අහිත, අවැඩ, ව්‍යසනය පිණිස හේතුවන දර්ශනයක් හඳුන්වා දී ඇත්තේ,
(1) පූර්ණ කස්සප ය. (2) මක්ඛලී ගෝසාල ය. (3) අජිත කේශකම්බලී ය.
(4) සංජය බෙල්ලට්ඨිපුත්ත ය. (5) නිගණ්ඨනාථ පුත්ත ය.

09. බුද්ධකාලීන භාරතීය දේශපාලන තොරතුරු ගවේෂණයේ දී ප්‍රකටව පෙනෙන වැදගත් සංකල්පයක් ලෙස "මත්ස්‍ය න්‍යාය" හඳුනාගත හැකිය. එය,
(1) රාජ්‍යයක සම්පත් බෙදී යායුතු ආකාරය පිළිබඳ න්‍යායකි.
(2) රටවැසියන් පාලනය කිරීම හා සම්බන්ධ න්‍යායයකි.
(3) මහා රාජ්‍යයන්ගේ දේශ සීමා පුළුල් කර ගැනීමට ක්‍රියාත්මක කළ න්‍යායකි.
(4) අසල්වැසි රාජ්‍යයන් හා සුහදව කටයුතු කිරීම හා න්‍යායකි.
(5) කුඩා රාජ්‍යයන්ගේ දේශසීමා පුළුල් කර ගැනීමට ක්‍රියාත්මක කළ න්‍යායකි.

10. බුද්ධකාලීන භාරතයේ ක්‍රියාත්මක වූ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති කිහිපයක් පහත දැක්වේ.
A. පිය පුතු උරුමයෙන් බොහෝ විට රජ පදවිය උරුම වීම.
B. ව්‍යවස්ථාදායක විධායක අධිකරණ යන ත්‍රිවිධ බලතල කණ්ඩායමක් මගින් ක්‍රියාත්මක වීම.
C. දුර්වල රාජ්‍ය පාලකයන් පරදවා තම බලය පුළුල් කර ගැනීමට ක්‍රියා කිරීම.
D. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයක් මඟින් රාජ්‍ය පාලනය ක්‍රියාත්මක කිරීම.
E. යුවරජ පුරෝහිත, අධිකරණ නායක, සේනාධිපති මඟින් බලය ක්‍රියාත්මක වීම.
ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් සමූහාණ්ඩු පාලනයට අදාළ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) A සහ B (2) A සහ C (3) B සහ C.
(4) B සහ D (5) D සහ E

11. බුද්ධකාලීන භාරතීය සමාජය නාගරීකරණය වීමේ ප්‍රතිඵලයක් නොවන වරණය තෝරන්න.
(1) වෙළඳ නගර නිර්මාණය වීම.
(2) නව වෙළඳ ප්‍රජාවක් බිහිවීම.
(3) යුද ගැටුම් වර්ධනය වීම.
(4) සුරාසල් හා ගණිකා වෘත්තිය බිහිවීම.
(5) නගර ආශ්‍රිත ජනගහනය වර්ධනය වීම සීමා වීම.

12. "රාජ භටයන් පැවිදි නොකළ යුතුය" යන විනය නීතිය බුදුරජාණන් වහන්සේ විසින් පනවන ලද්දේ..... රජුගේ ඉල්ලීමට අනුවය.
(1) උදේනි (2) චණ්ඩපණ්ණක (3) අජාසත්ත
(4) කොසොල් (5) සේනීය බිම්බිසාර


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

13. ජනතාවගේ සිතුම් පැතුම් හා හැකියා හඳුනාගෙන කෘෂිකර්මාන්තයේ උදව්වන අයට බිජුවට හා ආහාර ද, වෙළඳාමට උනන්දුවන අයට ප්‍රාග්ධනය ද, රාජ්‍ය සේවාව රුචි වූවන්ට එක් වැටුප් ආදිය ද ලබා දීමට අනුබල දෙන බෞද්ධ දේශපාලන මූලධර්මය අන්තර්ගත වන්නේ,
(1) ජාතක පාලියේ ය. (2) චක්වත්ති සීහනාද සූත්‍රයේ ය. (3) මහා පරිනිබ්බාන සූත්‍රයේ ය.
(4) කූටදන්ත සූත්‍රයේ ය. (5) අග්ගඤ්ඤ සූත්‍රයේ ය.

14. යහපත් කොට යෙතැයි
සුන්දර තැනට සැපතැයි
සොඳුරු බස් කියතැයි

යනාදී පද්‍යයෙන් විස්තර වන බුදු ගුණය කුමක් ද?
(1) අරහං (2) සම්මාසම්බුද්ධ (3) සුගත
(4) බුද්ධ (5) භගවා

15. බ්‍රාහ්මයා ඉගැන්වීම් අනුව කාන්තාව වනාහි ආගමික, සාමාජික ආදි සියලු අයිතිවාසිකම් අහිමි ලාමක පැවතුම් ඇති තැනැත්තියක ලෙස හැඳින්වුවද භාරතීය ඉතිහාසයේ ඇතැම් යුගවලදී ඇය පුරුෂයා මෙන්ම සියලු වරප්‍රසාද භුක්ති විඳි අයුරු ඓතිහාසික තොරතුරුවලින් පැහැදිලි වේ. ඒ අනුව භාරතීය ඉතිහාසයේ කාන්තාව පූජනීයත්වයට පත්වූ බවට පැහැදිලි පුරා විද්‍යාත්මක සාධක හමුවන්නේ,
(1) ප්‍රාග් වෛදික යුගයේ දී ය. (2) වෛදික යුගයේ දී ය. (3) වේද මන්ත්‍ර යුගයේ දී ය.
(4) අරණ්‍යයක යුගයේ දී ය. (5) උපනිෂද් යුගයේ දී ය.

16. බුද්ධකාලීන භාරතීය කාන්තාවට බුදු සමයෙන් හිමිකර දුන් ආගමික නිදහස තහවුරු කෙරෙන වඩාත්ම සුදුසු වරණය තෝරන්න.
(1) මව "බ්‍රහ්ම" නාමයෙන් හැඳින්වීම.
(2) භික්ෂුණී ශාසනය ස්ථාපනය කිරීම.
(3) උපාසිකාවන්ට තනතුරු ප්‍රදානය කිරීම.
(4) භික්ෂුණීන්ට ගෘහිත තනතුරු ප්‍රදානය කිරීම.
(5) නිර්වාණබෝධයට ස්ත්‍රීත්වය බාධාවක් නොවන බව ප්‍රකාශ කිරීම.

17. බුදුරජාණන් වහන්සේ ධර්ම සන්නිවේදනයේ දී විවිධ ක්‍රම ශිල්ප අනුගමනය කළ බව බුද්ධ චරිතය තුළින් ප්‍රකට වේ. එහිලා රාහුලෝවාද සහ කසීභාරද්වාජ යන සූත්‍ර වලින් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේ ..... භාවිත කළ බවය.
(1) සෘජු දේශනා ක්‍රමය (2) උපමානුසාරී දේශනා ක්‍රමය (3) ප්‍රශ්නෝත්තර ක්‍රමය
(4) පැවැරුම් ක්‍රමය (5) සාකච්ඡා ක්‍රමය

18. මානව වර්ගයා නැමැති වෘක්ෂයෙහි අපමණ කලකට පසුව පිපෙන පිපුනාට පසුව ප්‍රඥා සුගන්ධයෙන් හා කරුණා මකරන්දයෙන් ලෝකය පුරවන අසාමාන්‍ය පුෂ්පය බුදුන් වහන්සේ ය. මෙලෙස බුදුන් වහන්සේගේ ගුණ වර්ණනා කළේ,
(1) මහාචර්ය මැක්ස් මුලර් ය (2) මහාචාර්ය ලක්ෂ්මී නරසු ය. (3) එඩ්වින් ආර්නෝල්ඩ් ය.
(4) බර්මුන්ඩ් රසල් ය. (5) ඇල්බට් අයින්ස්ටයින් ය.

19. බුද්ධකාලීන ශ්‍රාවකයන් වහන්සේලා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A. සූකරඛත ගල්ලෙනේ දී 'දීඝනඛ' පරිබ්‍රාජකයාට දේශනා කළ වේදනා පරිග්‍රහ සූත්‍රය අසා රහත් විය.
B. බුදුරජාණන් වහන්සේගේ වමත් සව් තනතුර ලැබූහ.
C. භික්ෂුණී ශාසනය පිහිටුවීමට පුරෝගාමීව ක්‍රියා කළහ.
D. සද්ධර්මය මතක තබා ගැනීමට හැකි නිසා "ධර්ම සේනාපති" තනතුර ලැබූහ.
E. බුදුරජාණන් වහන්සේගේ දකුණත් සව් තනතුර ලැබූහ.

ඉහත ප්‍රකාශ අතුරින් සැරියුත් මහරහතන් වහන්සේගේ චරිතය සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් වර්ණය කුමක් ද?
(1) A, B සහ D (2) B, C සහ E (3) B, D සහ E
(4) A, D සහ D (5) A, C සහ D

20. බුදු දහම කම්මවාදී, කිරියවාදී, විරියවාදී ධර්මයකි. පුද්ගලයා විසින් සචේතනිකව සිදු කරන හොඳ නරක ක්‍රියාවල විපාකය කර්තෘ විසින්ම දැරිය යුතු බව බුදු සමයේ ස්ථාවරයයි. සචේතනික ක්‍රියාවේ විපාකය කර්තෘ වෙත පැවැරෙන බැවින් ක්‍රියාව කරන්නාට ඒ සඳහා ..... පවත්නා බව බුදු සමයේ පිළි ගැනීමයි.

(1) විපාකයක් (2) විනිශ්චයක් (3) අධිෂ්ඨානයක්
(4) උත්තේජනයක් (5) ස්වච්ඡන්දතාවක්

21. පිහානට බෙදාගත් ආහාරයෙන් පවා කොටසක් දන් දී තිරිසන් සතෙකුගේ හෝ කුසගිනි නිවීමට උනන්දු වූ ධර්මදාස උපාසක මහතා සියලු දනාට දයාබර වදනින් ඇමතීමටත්, අවම වශයෙන් ප්‍රියමනාප සිනහවකින් හෝ සංග්‍රහ කිරීමටත් පුරුදුව සිටියේ ය. නිති පන්සිල් පොහෝ අටසිල් හොඳින් සුරකී ඔහු, තමා හොඳින්ම දන්නා බණපොත් වුවද ශබ්ද නගා කිය වූයේ ශ්‍රාවක උවැස උවැසියන්ගේ යහපත උදෙසාමය. ලොකු කුඩා, බාල මහළු, දුප්පත් පොහොසත් භේදයකින් තොරව සියලු දෙනා වෙත සමසිතින් යුතුකම් ඉටු කළ ධර්මදාස උපාසක මහතා සරලවූත් සුන්දරවූත් තෘප්තිමත් ජීවිතයක් ගත කළේය. ඉහත සඳහන් සමස්ත ඡේදයට අනුව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ ධර්මදාස උපාසක මහතා

(1) හොඳින් දන් දුන් බවයි.
(2) ප්‍රිය වදනිනන් අන් අය ඇමතූ බවයි.
(3) අන් අයගේ යහපත උදෙසාත් කැප වූ බවයි.
(4) උසස් පහත් භේදයක් නොසලකා ක්‍රියා කළ බවයි.
(5) සතර සංග්‍රහ වස්තු හොඳින් ප්‍රගුණ කළ බවයි.

22. වීතරාගී උතුමන් වහන්සේලා සෞන්දර්ය රසාස්වාදය කළ ආකාරය ථේර - ථේරී ගාථාවලින් තහවුරු වේ. එහිලා අජකරණීය නදී තීරය බවුන් වැඩීමට තෝරා ගනිමින් එහි සුන්දරත්වය අත්විඳින ලද්දේ,

(1) කාළුදායි තෙරුන් වහන්සේය
(2) ගෝධික තෙරුන් වහන්සේ ය.
(3) වනවච්ච තෙරුන් වහන්සේ ය.
(4) සප්පක තෙරුන් වහන්සේ ය.
(5) කාලපූට තෙරුන් වහන්සේ ය.

23. බුදු සමය අනුදත් පරිභෝජන දර්ශනයෙහි එන සංකල්ප අතුරින් "අගරීනෝ" යන්නෙන් අදහස් කර ඇත්තෙ,

(1) දැඩි උපාදානයෙන් තොරව ධනය පරිහරණය කළ යුතුය යන්න ය.
(2) අත්හැරීමේ නුවණින් යුතුව ධනය පරිහරණය කළ යුතුය යන්න ය.
(3) ගැති නොවී ධනය ධනය පරිහරණය කළ යුතුය යන්න ය.
(4) ආදීනව දකිමින් ධය ධනය පරිහරණය කළ යුතුය යන්න ය.
(5) මූර්ජා නොවී ධනය ධනය පරිහරණය කළ යුතුය යන්න ය.

24. "සුඛ කාමානි භූතානි" ලෙසට මිනිසා සුඛකාමී සත්වයෙකු ලෙස සලකන බුදුසමය ලෞකික වූත්, ලෝකෝත්තර වූත් සැප රැසක් ඇති බව උගන්වයි. මේවා අතරින් "අත්හැරීමේ සුවය" හඳුන්වන්නේ,

(1) සාමිස සුඛ නමිනි. (2) නෙක්ඛම්ම සුඛ නමිනි. (3) කොම සුඛ නමිනි.
(4) නිරාමිස සුඛ නමිනි. (5) අනවජ්ජ සුඛ නමිනි.

25. ධන සම්පත් කළමනාකරණය පිළිබඳ සිගාලෝවාද සූත්‍රාගත උපදේශනය මඟින් බුදුසමය නිර්දෙශ කොට ඇත්තේ උපයන ලද සම්පත් කොටස් හතරකට බෙදා පරිභණය කළ යුතු බවය. ඒ අනුව පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) දෙකොටසක් ආයෝජනයටත් පරිභෝජනයට හා සංරක්ෂණයට එක් කොටස බැගිනුත් යෙදවිය යුතු බවයි.
(2) දෙකොටසක් පරිභෝජනයටත් ආයෝජනයට හා සංරක්ෂණයට එක් කොටස බැගින් යෙදවිය යුතු බවයි.
(3) දෙකොටසක් ආයෝජනයටත් වෙන් කොට අය වැය සමව පවත්වාගෙන යා යුතු බවිය.
(4) ආයෝජනයට හා සංරක්ෂණයට මෙන්ම මහණ බමුණන්ට දන් දීම ආදී පරලොව හිත පිණිස ද කොටසක් වෙන් කළ යුතු බවයි.
(5) දෙකොටසක් සංරක්ෂණයටත් පරිභෝජනයට හා ආයෝජනයට එක් කොටස බැගිනුත් යෙදවිය යුතු බවයි.


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

26. සිගාල ගෘහපති පුත්‍රයා අරබයා දේසිත සිගාලෝවාද සූත්‍රයෙහි එන සදිසා වන්දනය තුළින් නිරූපිත අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් කිහිපයක් පහත දැක්වේ.

A. යහපත් සිතින් අනුකම්පා කිරීම හා ආශිර්වාද කිරීම.
B. පවින් වැලැක්වීම.
C. සුදුසුකළ ආවාහ විවාහ කර දීම.
D. සුදුසුකළ වැඩ පැවැරීම.
E. යහපතෙහි යෙදවීම.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් දෙමාපියන් හා මහණ බමුණන් යන දෙපක්ෂයේම යුතුකමක් වන්නේ,

(1) A සහ E (2) A සහ D (3) C සහ D (4) B සහ E (5) B සහ D

27. "යො මාතරංවා පිතරංවා" මෙම ගාථා පාඨය ඇතුළත් වන සූත්‍රය කුමක් ද?

(1) මහා මංගල (2) සිඟාලෝවාද (3) ව්‍යග්ඝපජ්ජ
(4) වසල (5) පරාභව

28. ගිහි සමාජයේ අභිවෘද්ධිය සඳහා මංගල සූත්‍රයේ ඉගැන් වූ කරුණු අතරින් පවුලක එදිනෙදා යහපැවැත්මට අදාළ කර ගත හැකි ඉගැන්වීමක් නොවන්නේ,

(1) මාතා පිතූ උපට්ඨානං යන්න ය.
(2) පුත්තදාරස්ස සංගහෝ යන්න ය.
(3) නිබ්බාණ පච්චිකිරියාව යන්න ය.
(4) සුභසිතාව යා වාචා යන්න ය.
(5) අසේවනාව බාලානං යන්න ය.

29. "උට්ඨානවතෝ සතිමතෝ
සුචිකම්මස්ස නිස්සම්මකාරිනෝ
සඤ්ඤතස්සච ධම්මජීවිනෝ
අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති."

මෙම ධම්මපද ගාථාවට අනුව "පුද්ගලයාගේ යසස වැඩීමට" හේතු නොවන කරුණ වන්නේ,

(1) නොපසුබට උත්සාහයෙන් ක්‍රියා කිරීම ය.
(2) සුදුසු ප්‍රදේශයක වාසය කිරීම ය.
(3) එළඹී සිහියෙන් යුක්ත වීම ය.
(4) දැහැමි ජීවිතයක් ගත කිරීම ය.
(5) නොපමාව කටයුතු කිරීම ය.

30. බුදුරජාණන් වහන්සේ වෙත පූජා කරන ලද ආරාම, කිහිපයක නම් පහතින් දැක්වේ. එම ආරාම නාමයන්ට ඉදිරියෙන් දැක්වෙන අදාළ පූජාව සිදු කරන ලද පුද්ගල නාමාවලින් දෙකක් පමණක් නිවැරදි ය. එම නිවැරදි යුගය දෙක ඇතුළත් වරණය තෝරන්න.

A. නිග්‍රෝධාරාමය - සෝෂිත සිටුතුමා
B. රාජකාරය - කොසොල් රජතුමා
C. වේළුවනාරාමය - කපිල වස්තුපුර ශාක්‍යයන්
D. ජේතවනාරාමය - ජේත කුමරු
E. පූර්වාරාමය - විශාඛා උපාසිකාව

(1) B සහ E (2) A සහ C (3) C සහ E (4) C සහ D (5) A සහ B

31. සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 කට පසුව මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් හා ධර්මාශෝක රජුගේ රාජානුග්‍රහයෙන් පැළලුප් නුවර අශෝකාරාමයේ දී තෙවන ධර්ම සංගායනාව පැවැත්වූ බව සඳහන් වේ. එහිදී සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය උදෙසා ගත් තීරණ රැසකි. ඒ සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) ධර්ම විනය කොටස් කර එහි වගකීම භානක පිරිස් වලට පැවරීම.
(2) ලාභාපේක්ෂාවෙන් සසුන්ගත වූ අන්‍යතීර්ථකයන් 60000 ක් සසුනින් නෙරපීම.
(3) වසර 7 ක් නතර ව පැවැති භික්ෂු විනයධර්ම කිරීම නැවැත ආරම්භ වීම.
(4) කථාවත්ථුප්පකරණය රචනා කිරීමෙන් අභිධර්ම පිටකය සම්පූර්ණ වීම.
(5) ජාත්‍යන්තර බුදු දහමේ ව්‍යාප්තිය සිදු වීම.

32. කණිෂ්ක රජතුමා විසින් බුදුසමයේ විරස්ථිතිය පිණිස සිදු කරන ලද සේවාවන් තුනක් පහත සඳහන් ප්‍රකාශවල අන්තර්ගත වේ.

A. සිව්වන ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වීම.
B. විසිරී පැවැති ධර්ම විනය පිළිවෙළකට ඒකාරශී කිරීම.
C. ධර්මය තඹපත්වල ලියා ශෛලමය මංජුසාවක තැන්පත් කර මහා සෑයක් ඉදි කිරීම.
D. ධර්ම මහාමාත්‍යවරු පත් කොට ධර්ම ප්‍රචාරය කිරීම.
E. කාසි වලට බුදුරුව ඇතුළත් කිරීම.

නිවැරදි ප්‍රකාශ තුන ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B සහ C (2) A, C සහ E (3) B, C සහ D
(4) B, D සහ D (5) B, C සහ E

33. බෞද්ධ දර්ශනය පමණක් නොව භාෂ සාහිත්‍යාදි විවිධ විෂය ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනය, අධ්‍යාපනය හා පර්යේෂණ සඳහා ප්‍රකට වූ කීර්තිමත් විශ්ව විද්‍යාල ගණනාවක් භාරතයේ පැවැතුණි. මෙම විශ්ව විද්‍යාලවලින් බොහොමයක් මහායාන බෞද්ධ ඉගැන්වීම්වලට මූලිකත්වය ලබා දුන්හ. එක් පැරණි බෞද්ධ විශ්ව විද්‍යාලයක් මහායාන නොවන බෞද්ධ නිකායවලට අයත් විශ්ව විද්‍යාලයකි. එම අධ්‍යාපන ආයතනය වූයේ,

(1) නාලන්දා විශ්ව විද්‍යාලය ය. (4) වික්‍රමශීලා විශ්ව විද්‍යාලය ය.
(2) ජගන්දලා විශ්ව විද්‍යාලය ය. (5) ඕදන්තපුරී විශ්ව විද්‍යාලය ය.
(3) වලභී විශ්ව විද්‍යාලය ය.

34. මිහිඳු මාහිමියන් ප්‍රමුඛ දූත කණ්ඩායමක් විසින් ලක්දිවට බුදුසමය හඳුන්වා දෙනු ලැබූහ. මෙහිදී මිහිඳු හිමියන් ධර්ම දේශනා රාජ්‍යයක් සිදු කළ බවත්, මෙරට විශාල ජන සංඛ්‍යාවක් බුදුසමය වැළඳගත් බවත් ඓතිහාසික මූලාශ්‍රවල සඳහන් වේ. ඒ අනුව මිහිඳු හිමියන් මෙරටට පැමිණ මුල් දින කිහිපය තුළ දී දේශනා කරන ලද සූත්‍ර ලෙස සඳහන් වන්නේ,

(1) චුල්ලහත්ථිපදෝපම, ආසිවිසෝපම, මහාසමය යන සූත්‍රය.
(2) චුල්ලහත්ථිපදෝපම, දේවදූත, කූටදන්ත යන සූත්‍රය.
(3) චුල්ලහත්ථිපදෝපම, අනවග්ගිය, මහා සුදස්සන යන සූත්‍රය.
(4) චුල්ලහත්ථිපදෝපම, අනවග්ගිය, දේවදූත යන සූත්‍රය.
(5) චුල්ලහත්ථිපදෝපම, අග්ගික්ඛන්දෝපම, සාමගාම යන සූත්‍රය.

35. ඓතිහාසික වාර්තා අනුව චේතියගිරියේ අටසැට ලෙන් ඉදිකොට භික්ෂූන්ට පූජා කරන ලද්දේ,

(1) වලගම්බා රජු (2) මහසෙන් රජු (3) දුටුගැමුණු රජු
(4) සද්ධාතිස්ස රජු (5) දේවානම්පියතිස්ස රජු

36. පහතින් දැක්වෙන්නේ මහා විහාරය හා අභයගිරිය යන ආයතන දෙක සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි.

A. කුත්තවංක පිරිවෙන මහා විහාරයට අනුබද්ධ ආයතනයකි.
B. කනිට්ඨතිස්ස රජු ගාමිනී තිස්ස ජලාසය ඉදි කළේය.
C. මූලායතන පිහිටුවමින් ආරාමික අධ්‍යාපනය පෝෂණය කළේය.
D. රත්න ප්‍රාසාදය මහානාග තෙරුන්ට පූජා කිරීම.
E. පාලි අටුවාකරණය සඳහා බුද්ධඝෝෂ හිමියන්ට පහසුකම් සැළසීම.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් අභයගිරි සම්ප්‍රදායන් අයත් ප්‍රකාශ දෙක ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A සහ C (3) B සහ D
(4) B සහ E (5) C සහ D

37. "මාගේ මේ ව්‍යායාමය කිසි කලෙකත් රජසැප පිණිස නොව සම්බුද්ධ ශාසනයේ විරස්ථිතිය සඳහා ය" මෙම ප්‍රකාශයෙන්,

(1) පරෝපකාරය ගැන පැවැසේ. (4) ද්විහිංසාව ගැන පැවැසේ.
(2) ආගන්තුක සත්කාරය ගැන පැවැසේ. (5) ශාසන මාමකත්වය ගැන පැවැසේ.
(3) ගිලානෝපස්ථාන ගැන පැවැසේ.


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

38. 1871 දී බුරුමයේ මණ්ඩලේ නුවරදී භික්ෂූන් වහන්සේලා දෙදහස් දෙසීය නමකගේ සහභාගිත්වයෙන් පවත්වන ලද සංගායනාව පස්වන ථේරවාදී සංගායනාව ලෙස සලකනු ලැබේ. මෙම සංගායනාවෙන් පසු කිරිගරුඬ ලෑලි හත්සිය වසිහයක ත්‍රිපිටකය ලියවා තැනක් කරන ලදි. මේ සඳහා අනුග්‍රහය සපයන ලද්දේ,

(1) අනවරථ රජතුමා ය. (2) මින්ඩොන්මින් රජතුමා ය. (3) කෙයංසිත්ථ රජතුමා ය.
(4) ධම්මචේතිය රජතුමා ය. (5) බෙදුන්දපයා රජතුමා ය.

39. තායිලන්තයට බුදුසමය සම්ප්‍රාප්ත වීම හා එරට බුදු සමයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් වන අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ක්‍රි.පූ. 329 දී නකොම් පටොම් නගරය ආශ්‍රිතව බුදු සමය ව්‍යාප්තව පැවැතුණි.
(2) ක්‍රි.පූ. 700 දී පමණ පලුම්භාත් රජුගේ අනුග්‍රහයෙන් මහායන බුදුසමය ව්‍යාප්තිය.
(3) ක්‍රි.පූ. 7 වන සියවසේ ද්වාරවත් රාජ්‍යයේ බුදුසමය සමෘද්ධිමත්ව පැවැතීම.
(4) ක්‍රි.පූ. 11 වන සියවසේ බුරුම අනුරුද්ධ රජුගේ අනුග්‍රහයෙන් බුදුසමය ව්‍යාප්ත වීම.
(5) බුදුරදුන් ජීවමාන සමයේ භාරත - ථායි වෙළඳ සබඳතා මාර්ගයෙන් බුදු සමය ව්‍යාප්ත වීම.

40. ශ්‍රී ලංකාවෙන් චීනයට වැඩම කළ දේවධාර භික්ෂුණිය ඇතුළු භික්ෂුණීන් කණ්ඩායම විසින් ක්‍රි.ව. 433 දී පමණ චීනයේ භික්ෂුණී ශාසනය ප්‍රතිෂ්ඨාපනය කළ බව ඓතිහාසික වාර්තාවලින් පැහැදිලි වේ. මෙම භාරදූර කටයුක්ත වෙනුවෙන් සහයෝගය ලබා දුන් භික්ෂූණ් වහන්සේ වූයේ,

(1) සංඝධර්මන් ය. (4) චූපාලන් ය.
(2) බෝධි ධර්මය (5) ෆාහියන් ය.
(3) කුමාර ජීවය

41. ජපන් ජනයා විසින් බෞද්ධ චාරිත්‍රානුකූලව, මහත් හරසරින් වාර්ෂිකව සමරනු ලබන මළවුන් පිදීමේ උත්සවය ..... නමින් හැඳින්වේ,

(1) ජෝදෝෂ් (2) නෙහං ඒ (3) හනමග්සුරි
(4) බොන් (5) සුහිය්

42. මථුරා බුදු පිළිමයේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ ලෙස දැක්විය හැක්කේ,

(1) ශාක්‍යසිංහ ලීලාව, විවෘත නෙත්, ස්වභාවික හිස කෙස් ය.
(2) ශාක්‍යසිංහ ලීලාව, විවෘත නෙත්, කැරළි ගැසුණු හිස කෙස් ය.
(3) ශාක්‍යසිංහ ලීලාව, අඩවන් නෙත්, කැරළි ගැසුණු හිස කෙස් ය.
(4) ශාක්‍යසිංහ ලීලාව, අඩවන් නෙත්, කැරළි ගැසුණු හිස කෙස් ය.
(5) ශාක්‍යසිංහ ලීලාව, අඩවන් නෙත්, ස්වභාවික හිස කෙස් ය.

43. සෑම බුද්ධ ප්‍රතිමාවක්ම කිසියම් පණිවුඩයක් සන්නිවේදනය කරන මුද්‍රාවක් සහිතව නිර්මාණය කොට ඇත. ඒ අනුව ඉන්දියාවේ සුප්‍රකට සාරානාත් බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කොට ඇත්තේ,

(1) අභය මුද්‍රාවෙනි. (2) විතර්ක මුද්‍රාවෙනි. (3) වරද මුද්‍රාවෙනි.
(4) ධර්මචක්‍ර මුද්‍රාවෙනි. (5) භූමිස්පර්ශ මුද්‍රාවෙනි.

44. "බුදු පසේබුදු මහරහත් සහ සක්විති රජු ය ථූපාර්ණ පුද්ගලයන් සඳහා ස්තූප නිර්මාණය කළ යුතු යැයි" බුදුරදුන් අනුදැන දේශනාව ඇතුළත් වන්නේ,

(1) මහා පරිනිබ්බාණ සූත්‍රයේ ය. (4) චුල්ලහත්ථිපදෝපම සූත්‍රයේ ය.
(2) මහාපදනා සූත්‍රයේ ය. (5) ධම්මචක්කප්පවත්තවන සූත්‍රයේ ය.
(3) ලක්ඛණ සූත්‍රයේ ය.

45. ස්තූපයේ ආරක්ෂාව සඳහා කලාකරුවා විසින් නිර්මාණය කරන ලද ගෘහ විශේෂය හැඳින්වූයේ,

(1) අටදාගේ නමිනි. (2) හැටදාගේ නමිනි. (3) වටදාගේ නමිනි.
(4) ගෙඩිගේ නමිනි. (5) චෛත්‍යශාලා නමිනි.

46. අනුරාධපුර යුගයේ දී නිර්මාණය වූ ශ්‍රී ලාංකේය සඳකඩ පහණ පොළොන්නරුව හා මහනුවර යුගවල දී සැලකිය යුතු වෙනස්කම් වලට ලක්ව තිබේ. එහිදී සිදු වූ වෙනස්කම් කිහිපයක් පහත දැක්වේ.

A. සතුන් වෙන් වෙන්ව පේළිවල දැක්වීම.
B. සඳකඩ පහණ ප්‍රමාණයෙන් විශාල වීම.
C. අර්ධපද්මය පූර්ණ පද්මය බවට පත්වීම.
D. සඳකඩ පහණේ කවාකාර හැඩය ත්‍රිකෝණාකාර වීම.
E. සත්වරූපවලින් ගවයා ඉවත් වීම.

ඉහත වෙනස්කම් අතරින් මහනුවර යුගයට අයත් සඳකඩ පහණේ දක්නට ලැබෙන විශේෂතා දෙකක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A සහ C (3) B සහ D
(4) C සහ D (5) D සහ E

47. අනුරාධපුරයේ දක්නට ලැබෙන බොහෝ ..... ශීර්ෂය කර මුඛයකින් නිකුත්වන ලියවැලක විලාසය ගත් අතර එම ලියැවල කෙළවර වන්නේ විශාල වෘත්තාකාර දහරයක් හෙවත් සංසූරිලතාකරණයකින්ය.

(1) මුරගල්වල (2) වහල්කඩවල (3) පිටගැටපෙළ
(4) සඳකඩපහන්වල (5) කොරවක්ගල්වල

48. ඇත අතීතයේ පමණක් නොව වර්තමානයේ පවා ලාංකික ජනසමාජයේ කලා රසාස්වාදය පිරිස සිදු කරනු ලබන බොහෝ නිර්මාණයන්ගේ දැකිය හැක්කේ බෞද්ධාභාෂයයි. බෞද්ධ තේමා මුල්කරගත් ගීත නාට්‍ය පමණක් නොව චිත්‍රපට වලට ද වර්තමාන සමාජයේ ඉතා ඉහළ ප්‍රතිචාර ලැබේ. මෙයට හොඳට උදාහරණය මහාචාර්ය සරත්චන්ද්‍රයන්ගේ නිර්මාණයන්ය. සරත්චන්ද්‍රයන් මනමේ නාට්‍ය නිර්මාණය කළේ බෞද්ධ ජාතක කතාවක් පදනම් කර ගෙනය. ඊට වස්තු විෂය වූ ජාතක කතාව වූයේ,

(1) චුල්ල ධනුද්ධර ජාතකයයි. (2) සේරිවාණිජ ජාතකයයි. (3) උම්මග්ග ජාතකයයි.
(4) ලෝමහංස ජාතකයයි. (5) කුස ජාතකයයි.

49. සිංහල ගද්‍ය හා පද්‍ය සාහිත්‍යයේ පෝෂණයට මෙන්ම නාට්‍ය කලාවේ පෝෂණයට බුදු දහමේ ආභාෂය ලැබී ඇත. ඒ අනුව දඹදෙණි යුගයේ දෙවෙනි පැරකුම්බා රජු විසින් රචිත 'කව්සිළුමිණට' පදනම් ව ඇත්තේ,

(1) මඛාදේව ජාතකයයි. (2) සස ජාතකයයි. (3) කුස ජාතකයයි.
(4) සත්තුභත්ත ජාතකයයි. (5) ගුත්තිල ජාතකයයි.

50. මහනුවර යුගයට අයත් දෙගල්දොරු විහාරයේ චිත්‍ර ද සමකාලීනව දහඅටවන සියවසේ අඳින ලද වෙනත් විහාරවල දක්නට ලැබෙන චිත්‍ර ද සම්ප්‍රදාය හා ශෛලීය අතින් පොළොන්නරුවේ චිත්‍රවලට බෙහෙවින් වෙනස් වේ. එවැනි එක් වෙනසක් ලෙස දැකිය හැකි වන්නේ,

(1) බුද්ධිගෝචර බවයි.
(2) අක්ෂිගෝචර බවයි.
(3) තාත්වික බවයි.
(4) අවකාශය බහුලව යොදාගෙන තිබීමයි.
(5) පර්යාලෝකය දක්වා තිබීමයි.

***


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki


# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## ஊவா மாகாண கல்வித் திணைக்களம்
## Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2025
**General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2025**

| 13 ශ්‍රේණිය | 45 | S | II | බෞද්ධ ශිෂ්ටාචාරය II<br>**Buddhist Civilization II** | කාලය : පැය තුනයි<br>**Time : Three hours** |
|---|---|---|---|---|---|


**අමතර කියවීම් කාලය : මිනිත්තු 10 යි.**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස් :**

- I කොටසින් ප්‍රශ්න **දෙකක් ද,** II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් හිමි වේ.

## I කොටස

(1). (i) බ්‍රාහ්මණ ඉගැන්වීම්වල දැක්වෙන "ආපද්ධර්ම" කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02 යි)

(ii) යාගයක් පැවැත්වීමට ප්‍රමුඛවන බ්‍රාහ්මණ පූජකවරුන් හතර දෙනා හඳුන්වන්න. (ලකුණු 03 යි)

(iii) බ්‍රාහ්මණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ 4 ක් ගෙනහැර දක්වන්න. (ලකුණු 04 යි)

(iv) අජිත කේසකම්බලගේ දස වස්තුක මිථ්‍යාදෘෂ්ටිය හඳුන්වා දෙන්න. (ලකුණු 05 යි)

(v) පූර්ණකස්සපගේ අකිරියවාදී දර්ශනය සැකෙවින් හඳුන්වා එය බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් විමසීමට ලක් කරන්න. (ලකුණු 06 යි)

(2). (i) බුදු රජාණන් වහන්සේගේ "සත්ථා දේවමනුස්සානං" ගුණය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02 යි)

(ii) බුද්ධකාලීන භාරතයේ පැවති රාජාණ්ඩු පාලන ක්‍රමයේ අනන්‍යතා ලක්ෂණ තුනක් ගෙන හැර දක්වන්න. (ලකුණු 03 යි)

(iii) බුද්ධ කාලීන භාරතීය සමාජය වාණිජ්‍යකරණය වෙමින් පැවති බවට සාධක හතරක් ගෙනහැර දක්වන්න. (ලකුණු 04 යි)

(iv) තාදි ගුණයෙන් ශ්‍රාවකයාට ලැබිය හැකි ආදර්ශයක් සංක්ෂිප්තව ඉදිරිපත් කරන්න. (ලකුණු 05 යි)

(v) අනාථපිණ්ඩික උපාසක තුමාගේ චරිතයෙන් වර්තමාන සමාජයට ලබා ගත හැකි ආදර්ශ 5 ක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(3). (i) "යෝ චේ වස්සසතං ජීවේ ....." යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත (3)(i) හි සඳහන් ගාථාවේ අර්ථය නිවැරදිව ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(iii) සිගාලෝවාද සූත්‍රයට අනුව ගිහි පැවිදි යුතුකම් හා වගකීම් නම් කරන්න. (ලකුණු 04 යි)

(iv) පුද්ගලයාගේ පරිහානියට හේතුවන පරාභව සූත්‍රාගත කරුණු පහක් කෙටියෙන් දක්වන්න. (ලකුණු 05 යි)

(v) පුද්ගලයාගේ මෙලොව දියුණුවට හේතුවන මංගල සූත්‍රාගත කරුණු භයක් පිළිබඳ කෙටි විවරණයක් කරන්න. (ලකුණු 06 යි)

## II කොටස

(4). (i) චතුර් වර්ණයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ විග්‍රහය ගෙන හැර දක්වන්න. (ලකුණු 10 යි)

(ii) රටක ආර්ථික සමෘද්ධිය විෂයයෙහිලා දේශපාලන මැදිහත්වීම කෙසේ සිදුවිය යුතු දැයි බෞද්ධ දේශපාලන මූලධර්ම ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10 යි)

(5). (i) හොඳ නරක විනිශ්චය පිළිබඳ බෞද්ධ නිර්ණායක සර්වකාලීන වටිනාකමකින් යුක්ත වන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 10 යි)

(ii) කලා රස විඳීමය ප්‍රබුද්ධ හා සංවේදී මිනිසකු සතු උසස් ගුණාංගයක් බව සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

(6). (i) බුදුරජාණන් වහන්සේගේ ධර්මදූත කාර්යය සාර්ථක කර ගැනීමට භික්ෂු - භික්ෂුණී උපාසක උපාසිකා යන පිරිස්වලින් ලැබුණ අනුග්‍රහය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10 යි)

(ii) ප්‍රාග් බෞද්ධ යුගයේ ශ්‍රී ලාංකීය ජනතාව අතර ප්‍රචලිතව පැවති ඇදහිලි හා විශ්වාස නිදසුන් මඟින් ප්‍රකට කරන්න. (ලකුණු 10 යි)

(7). (i) පුද්ගලයාගේ උපතේ සිට මරණය දක්වා සිදු කෙරෙන චාරිත්‍ර විධි විෂයයෙහි බෞද්ධාභාෂය ලැබී ඇති අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

(ii) මියන්මාරයට බුදුසමය හඳුන්වා දීමේ ඓතිහාසික පසුබිම කෙටියෙන් දක්වා එරට ජනජීවිතය බුදු සමයෙන් පෝෂණය වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

(8). (i) ශ්‍රී ලාංකේය ස්තූප කලාවේ ආරම්භය හා විකාශය පිළිබඳ විචාරාත්මක විවරණයක් කරන්න. (ලකුණු 10 යි)

(ii) පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** ප්‍රමාණවත් විස්තර සපයන්න.

I. දස කුසල්

II. අභයගිරිය

III. දඹදෙණි සාහිත්‍ය යුගය

IV. වික්‍රමශීලා විශ්ව විද්‍යාලය

(ලකුණු 05 x 2 = 10 යි)




අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

LOL
Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

# 25% OFF
# ALL BOOKS

**Including Exercise Books,
CR Books, and B5 Books**



**ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්**

## ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

**Cash On Delivery Available**

# ORDER GCE A/L SHORT NOTES, MODEL, REVISION BOOKS & PAST PAPERS IN SINHALA, ENGLISH & TAMIL MEDIUM





# LOL BOOK STORE

**CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE**

**WHATSAPP - 0717774440**

**WEBSITE: WWW.LOL.LK**

## GET READY FOR YOUR A/Ls WITH LOL BOOK STORE!